# මා දුටු දිට්වා



සදිල්මි හස්මිකා කීර්තිරත්න

# මා දුටු දිව්වා

## සදිල්මි හස්මිකා කීර්තිරත්න

කතෘ

කතෘගේ වෙනත් කෘති...

- අත්තම්මයි සයුරියි
- දඟකාර රෝසී

පාසල := මහාමායා බාලිකා විද්‍යාලය

පංතිය := 5 - A

දිනය := 2026/05/06

# පිදුම

මා මෙලොවට බිහි කර ජීවිතය

කියා දුන් මගේ ආදරණීය

මවුපියන්ට හා ගුරු හරුකම් කියා

දුන් ගුරුහවතුන්ට සෙනෙහසින්

පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලාවට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.


සරත් බී.එස්. අභයකෝන්,<br>
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.<br>
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.<br>
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍යා දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

අපි ජීවත් වුණේ මහනුවර නගරයේ ලේවැල්ල කියන ලස්සන ගමේ. අපේ නිවස තිබුනෙත් පුංචි කන්දක් උඩ. අපේ ගෙදරට හරි ලස්සනට මහවැලි ගඟ පේනවා. ගේ ඉදිරිපසට ලස්සන කඳු පන්ති පේන්න තියෙනවා. අපි හරිම සතුටින් ඒ ගෙදර ජීවත් උනේ. ඒ දවස් වල වැසි කාලය ආරම්භ වෙලා තිබුණේ. දවසක් රූපවාහිනියේ කිව්වා "දිට්වා" කියලා ලොකු සුළි කුණාටුවක් එනවා කියලා.

අපිට මුලින්ම ඒක අමුතු නමක් වගේ හිතුනත් අපේ අම්මා කිව්වා " පුතා මේක ලොකු සුළි කුණාටුවක්, අපි හැමොම පරිස්සම් වෙන්න ඕනේ" කියලා.

අහස කළු වලාකුළු වලින් පිරිලා තිබුණා. ගස්වැල් සුළඟට කම්පා වෙලා තිබුණා. මට ටිකක් බය හිතුනත් අපි හැමෝම එකට ඉන්න නිසා හිත සතුටු හිතුනා.



ඊලඟ දවසේ සුලඟයි වැස්සයි තවත් තද
වෙලා. විශාල වැහි බිංදු පොළවට
වැටෙනවා.
ගස්කොළන් ඔක්කොම තද
සුළඟට කැරකෙනවා.



තාත්තා ගෙදර දොර, ජනෙල් ඔක්කොම වහලා අපිත් එක්ක එක කාමරේකට ගියා. අපි හැමෝමදැන් එකට. මේ ඔක්කොම මට නරක හීනයක් වගේ.

මට දැන්න ලොකු බයක් දැනෙනවා. අපි හැමෝටම ගොඩක් වෙලා සැනසීමෙන් ඉන්න ලැබුනෙ නෑ.

අපි ඉන්නෙ කඳු ගොඩක් තියෙන පැත්තක. ඒ වගේම අපේ ගෙදර තියෙන්නෙත් කන්දක් උඩ. ඉතින් රෑ 12.00 ට විතර අපේ ගෙදරට උඩින් තිබ්බ පස් ඇල්ල කඩාගෙන පහලට ආවා. ඒක තනිකරම පස් ගොඩක්. අපේ ගෙදර මුලු පිටිපස්සම පස් ගොඩකින් යට වෙලා.ඒත් අපි කාටවත් කරදරයක් නෑ.



තාත්තා කිව්වා අපි ගෙදර සාලයට වෙලා ඉමු කියලා. අපි එළිය වැටෙනකම් හැමෝම නැගිටලා සාලෙට වෙලා හිටියා. උදේම තව තවත් වැස්ස තද උනා. තාත්තා කිව්වා අපි නැන්දලාගේ ගෙදර යමු කියලා. අම්මා අතට අහු උන දේවල් අරගෙන ඉක්මනට අපිවත් ලෑස්ති කරගෙන වාහනයට නැග්ගා. අපි යන පාරේ වතුර පාර සැරටම ගලනවා. ගහක් කඩාගෙන වැටිලා නිසා එක පාරක් වහලා. තාත්තා අනිත්

පාරෙන් යන්න වාහනේ හැරෙව්වා. "අම්මෝ... හොඳටම වැස්ස".



අපි යන පාරට පස් කඩාගෙන වැටුණා. අපේ පිටිපස්සෙන් හිටිය වාහන වල අය හෝන් ගහන්න ගත්තා. අම්මා කෑ ගහලා කිව්වා ඉක්මනට වාහනේ ගන්න කියලා. තාත්තා වේගෙන් වාහනේ ඉස්සරහට ගත්තා. මම අම්මා බදා ගත්තා. අම්මා මාව බදාගෙන බය වෙන්න එපා පුතේ කියලා කිව්වා. මට දැනෙන්නෙ මේක භයානක චිත්‍රපටියක් කියලා. මම කවදාවත් මෙහෙම දෙයක් දැකලා තිබුණේ නෑ. ටික වෙලාවකින් අපි නැන්දලාගේ ගෙදරට ගියා. නැන්දා අපි එනකම් පාර බලාගෙන හිටියා. අපිවත් එක්කගෙන ගෙට ගිය නැන්දා මාව ආදරයෙන් තුරුලු කරගත්තා.

වටේම තියෙන ලොකු ගස් සුළඟට ඒ මේ අත වැනෙනවා. සමහර ගස් කඩාගෙනත් වැටෙනවා මන් දැක්කා. එදා දවස ගෙවුනු විදිහ මට තාමත් හීනයක් වගේ. හැබැයි ඒ නරක දවස ගෙවිලා ඉවරයි. කිසිම දෙයක් නොවුනු ගානට දවස් කිහිපයකින් ඉර පායලා. මිනිස්සුන්ට හුඟක්

දේවල් නැතිවෙලා. ගෙවල් දොරවල් නැතිවෙලා.

ඒ අයට ආධාරත් දෙනවා කියල අපි දැනගත්තේ මිනිස්සුන්ගේ කට කතාවලින්. ආයෙත් විදුලිය ලැබිලා පාරවල් සුද්ද කරලා වාහන වලට යන්න පුලුවන් විදිහට පාර හදන්න සතියක්වත් යයි කියල අපේ තාත්තා කිව්වා. හරියටම දවස් 4කට පස්සෙ අපි ගෙදර එන්න පිටත් උනා.

මේ වෙනකොට හැමදේම සාමාන්‍ය වෙලා. හැමෝම නැතිවුණු දේවල් ගොඩනඟා ගන්න මහන්සි වෙනවා.

තව දෙයක්, ඔය මාස තුනකට කලින් මට උන නරකම සිදුවීමක්. මම ඒකට මුහුණ දුන්නා. ඒක තාමත් මට නරක හීනයක්. ඒත් අපි දැන් සාමන්‍ය විදිහට වෙනදාටත් වඩා හොදට අපේ වැඩ වෙනුවෙන් කැප වෙනවා.

නැති උන දේවල් ටික ටික ලබා ගන්නවා. මට තියෙන්නෙ එකම එක පැතුමයි." මෙවන් විපතක් නැවත කිසිදාක නොවේවා!" යන ප්‍රාර්ථනයයි...

9

# පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)